## ගත වර්ෂයක් ඉක්මවූ කෘෂිකාර්මික අධ්‍යාපනය

(ඇස්. නටේසන්)

### 11 කොටස.

### කෘෂිකාර්මික අධ්‍යාපනය සහ පුහුණුව ප්‍රතිසංවිධානය කිරීම.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කාර්ය භාරයන් වන පර්යේෂණ ව්‍යාප්ති අධ්‍යාපන සහ බීජ නිෂ්පාදන යන අංශ නව ඉඩම් හා කෘෂිකාර්මික නීතිමය ප්‍රතිපත්ති මත ප්‍රතිසංවිධානය කල යුතු බව 1970 වර්ෂ වලදී අවබෝධ විය. කෘෂිකාර්මික ඉඩම් පනත සහ කෘෂිකාර්මික ඵලදාවර්ධන පනත මගින් නිෂ්පාදන ක්‍රියාවලිය පුළුල් ගොවීන් හට ජාතික ගොවීන්ගේ සංවිධාන මගින් ක්‍රියාත්මක කිරීමට පවරණ ලදී. ඒ අනුව ඵලදාවර්ධන කමිටු මගින් කෘෂිකාර්මික වැඩ සැලසුම් කිරීම, කෘෂිකාර්මික ණය පහසුකම් සැළසීම, යෙදවුම් සැපයීම නිෂ්පාදනය, වෙළඳාම සහ ගොවියාගේ අධ්‍යාපනය ඵලදායි අන්දමින් දියුණු කිරීම යන කාර්යයන් ඉටු කිරීම භාරකරණ ලදී.

ඵලදාවර්ධන කමිටු වෙත පැවරුණ මෙම කාර්යයන් මගින් සඵල අන්දමින් ගොවි ජීවිතයට ලබාදීමේ කාර්යක්ෂමතාවය දියුණු කිරීම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට පැවරුණ කාර්යයයි.

වැඩිවන ව්‍යාප්ති සේවයට තාක්ෂණික දැනුම ලබාදීම, රැකියාවට පෙර පුහුණු වන්නන් හා ගොවි නිළධාරීන්ට සේවාස්ථ පුහුණු ලබාදීම, තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණු ලබාදීම ආදිය හා කෘෂිකර්ම ප්‍රවෘත්ති සේවාව පුළුල් කිරීමත් අරභයා 1975 වර්ෂයේදී අභිනවයෙන් කෘෂිකාර්මික අධ්‍යාපන හා පුහුණු අංශය පිහිටුවිනු ලදී.

## සේවාස්ථ පුහුණු.

කෘෂි පාරිසරික කලාප අනුව පර්යේෂණ හා ව්‍යාප්ති සේවය විමධ්‍යගත කිරීමත් සමඟ එළදාවර්ධනයේ නියුතු ක්ෂේත්‍ර නිළධාරීන්ට නව තාක්ෂණික දැනුම දීම යන කරුණු කෙරෙහි අවධානය යොමු විය.

පර්යේෂණ මගින් ලබාගත් නව තාක්ෂණික දැනුම වගා ව්‍යාප්ති නිළධාරීන්ට ලබාදීමට අවශ්‍ය විය. එමෙන්ම ක්ෂේත්‍රයේ ඇති ප්‍රශ්න පිළිබඳව පර්යේෂණ නිළධාරීන්ට දැනුම් දීමද අවශ්‍යවූයේ ගොවියාට අදාළ ප්‍රශ්න විසඳනු සඳහාය. මේ නිසා සේවාස්ථ පුහුණු අනිවාර්යයෙන්ම අවශ්‍ය විය. පර්යේෂණ හා ව්‍යාප්ති ක්ෂේත්‍රය යන දෙකොටස කිට්ටු සම්බන්ධ කරණය සඳහා සේවාස්ථ පුහුණු මධ්‍යස්ථාන ක්‍රියාත්මක විය. පේරාදෙණිය, මහඉලුප්පල්ලම, බිඳුණුවැව, අඟුණකොළ පැලැස්ස සහ කිලිනොච්චිය යන ස්ථානවල එවැනි මධ්‍යස්ථාන පහක් දැනට ක්‍රියාත්මකව ඇත. බෝම්බුවල හා කරදියන්ආරු යන ස්ථාන දෙකේද යථාකාලයේදී එවැනි මධ්‍යස්ථාන පිහිටුවනු ලැබේ. මාතලුර යන ස්ථානයේදී එවැනිම අටවන මධ්‍යස්ථානය 1983 වර්ෂයේදී ක්‍රියාත්මකවේ. කලාපීය පර්යේෂණ මධ්‍යස්ථාන වලට කිට්ටුව පිහිටුවා ඇති මෙම සේවාස්ථ පුහුණු මධ්‍යස්ථානවලට පරයේෂණ අංශය හා සම්බන්ධ වී ක්ෂේත්‍ර නිළධාරීන්ට නව තාක්ෂණය පිළිබඳ විශිෂ්ඨ පුහුණුවක් ලබාදීමට හැකියාවක් ඇත.

වර්ෂ කීපයක් ගතවෙත්ම අවශ්‍යතා අනුව පුහුණු සඳහා ඉඩකඩ පුළුල් විය. අද (සති 1 පුහුණු) වන විට බෝග වගා පිළිබඳ විවිධ මාතෘකා යටතේ පුහුණු, ජල පාලනය, පැලෑටි සංරක්ෂණය, ව්‍යාප්ත ක්‍රම, සංනිවේදනය, මීමැසි පාලනය ආදී විශේෂ පුහුණු ලබාදීමේ ද ාරතව ඇත. කෘෂිකර්ම ක්ෂේත්‍රයේ උසස් සේවාස්ථ පුහුණු ලබාදීමට රටේ ඇති හොඳම ස්ථාන මේවා බව කිව හැක. මෙම මධ්‍යස්ථාන

ප්‍රයෝජනයට ගනු ලබන්නේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිළධාරීන් පමණක් නොව වෙනත් දෙපාර්තමේන්තු හා රජයේ නොවන ආයතනද පුහුණු ලබා ගැනීම සඳහා මෙම මධ්‍යස්ථාන උපයෝගීකර ගනී. වී වගා ක්ෂේත්‍රයේ ඇති දක්ෂ විශ්වාසවන්ත ක්ෂේත්‍ර නිළධාරී පිරිස මෙම ප්‍රබල සේවාස්ථ පුහුණුවල ඇති ඵලදායී භාවය මැනවින් ඔප්පු කරයි.

ගොවිපල් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ විශේෂ සේවාස්ථ පුහුණුවක් ගොවිපල් යාන්ත්‍රික පුහුණු මධ්‍යස්ථානයේ ඇත. මෙම පුහුණුවේදී සති 1 – 2 දක්වා ගොවිපල් යන්ත්‍ර ක්‍රියාකරවීම සහ නඩත්තුව, අළුත්වැඩියා කිරීම, වැඩපල් තාක්ෂණය සහ පාලනය පිළිබඳ පුහුණු ලබා දෙනවා ඇත.

කෘෂිකර්ම විද්‍යාල :-

කෘෂිකර්මාන්තයේ තත්ත්වය උසස් වෙත්ම නිළධාරීන්ගේ අවශ්‍යතා ඉල්ලුම වැඩිවීමත්, උසස් මට්ටමේ දැනුම ඇති නිළධාරීනුත් අවශ්‍ය විය. ව්‍යාප්ති සේවය ඉටුකල යුත්තේ භාරදූර කර්තව්‍යයකි. මේ අනුව ඩිප්ලෝමා පුහුණුව වැඩි දියුණු කිරීමට සිදුවිය. නිළධාරීන්ට අවශ්‍ය අත්තිවාරම් දැනුම සඳහා ප්‍රබල සේවාස්ථ පුහුණුවක් ලබාදීම ඉතා වැදගත් විය. දෙවැනි කෘෂිකර්ම විද්‍යාලය පිරිමි සහ ගැහැණු ළමුන් සඳහා 1958 වර්ෂයේදී කුණ්ඩසාලේ විවෘත විය. මෙහි ඉගැන්වීමේ මාධ්‍ය වූයේ සිංහළ සහ ද්‍රවිඩ භාෂාවන්ය. 1967 වර්ෂයේදී කෘෂිකර්ම පාසැල් දෙක එක්තැන්කර සාමාන්‍ය පාඨමාලාව වෙනුවට විශේෂ පාඨමාලාවක් ඉගැන්වීම අරඹන ලදි. පළමු වසර අවසානයේදී ක්ෂේත්‍ර 5 ක එනම් ශස්‍ය විද්‍යාව, සත්ව විද්‍යාව, උද්‍යාන විද්‍යාව,

කෘෂිකර්ම ඉංජිනේරු විද්‍යාව සහ ග්‍රාමීය ගෘහ පාලනය යන ක්ෂේත්‍ර වල විශේෂ පුහුණුවක් දීමෙන් පසු මෙම අභ්‍යාසලාභීන් විශේෂ ක්ෂේත්‍රවල කටයුතු කිරීම සඳහා යෙදීමට බලාපොරොත්තු වුවත්, ඔවුන් සඳහා ඉල්ලුම අඩුවිය. එමනිසා නැවත සාමාන්‍ය පාඨමාලාව ඉගැන්වීම 1975 වර්ෂයේදී අරඹන ලදී.

රජය මගින් අරඹන ලද සංවර්ධන වැඩ පිළිවෙල සහ පුද්ගලික අංශය මගින් දක්වන ලද සැළකිල්ල නිසා ඩිප්ලෝමා ලාභීන්ට ඇති ඉල්ලුම වැඩිවිය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් තවත් කෘෂිකර්ම පාසැල් දෙකක් පැල්වැහැර සහ අගුණකොලපැලැස්ස යන ස්ථානවල 1981 වර්ෂයේදී විවෘත විය. ඒ අනුව ඩිප්ලෝමා පුහුණුව සඳහා ඇතුලත් කරගනු ලබන සංඛ්‍යාව 150 සිට 300 දක්වා වැඩිවිය. මෙම අයගෙන් අඩක් පමණ අනිකුත් දෙපාර්තමේන්තු වල ග්‍රාමීය මට්ටමේ නිළධාරීන් වශයෙන් සේවය කරයි. මෙම පුහුණුව උසස් කිරීම නිසා මේ අයට තමන්ගේ දක්ෂතාවය දියුණුකර ගැණීමත්, මනා සේවයක් ඉටුකිරීමට හැකියාවක් ඇතිවිය. විෂය මාලාව උසස් කර, වැඩිපුර නිළධාරීන් පත්කරණ ලදී. හොඳ තත්වයේ අපේක්ෂකයින් ඇතුලත්කර ගනු වස් ඇතුලත්වීමේ අධ්‍යාපන මට්ටම උසස් කරන ලදී.